# බෞද්ධ ශ්‍රාවක - ශ්‍රාවිකා චරිත හා සබැඳි බෞද්ධ පෙරහැර

ආචාර්ය,
දේශප්‍රිය ගුණසේන

## පෙරහැර වචනාර්ථ විමර්ශනය

පෙළහර සහ පෙරහැර යැයි සමානවාචී යෙදුම් දෙකකි. මෙම වචන දෙකම මාතෘ භාෂාවලින් තත්සම වී විකාශනය වී තිබේ. පෙළහර යන්න පටි+හර-හරණ, ගැනීම් අර්ථයෙහි යෙදෙන ණ්‍ය ප්‍රත්‍යයාන්ත නාමයකි. එය ප්‍රාතිහාර්ය > පාටිහාරිය > පෙළහර යැයි පද විකාශනය වේ. පටිසම්භිදාමග්ගට්ඨකථාවෙහි **පටිහරතීති පාටිහාරියං**[1] යැයි නිරුක්ති දක්වා තිබේ. වැලිවිටියේ සෝරත නාහිමියෝ ප්‍රාතිහාර්ය, ආශ්චර්ය, පෙරහර (මඟුල් පෙළහර)[2] යැයි අර්ථ තුනක් දක්වති.

පෙරහැර යන්න පරිහර - හරණ, ගැනීම් අර්ථයෙහි යෙදෙන නාමයකි. එය පරිහාර්ය > පරිහාර > පෙරහැර යැයි පද විකාශනය වේ. එහි නිරුක්තිය වන්නේ **පරිහරතීති පාරිහාරියං** යනුයි. වැලිවිටියේ සෝරත නාහිමියෝ පෙරහැර යන්නට පරිහාරය-සත්කාරය, සැරසීමට ගන්නා ධ්වජ කලස් ආදි භාණ්ඩ, පිරිවර (මඟුල් පෙළහර)[3] යැයි අර්ථ දක්වති. එම අර්ථ අතරින් සත්කාරය සහ පරිහාරය වඩාත් යෝග්‍ය අර්ථ ලෙස ගෙනහැර පාති. පාලි කෝෂ ග්‍රන්ථයන්හි පාටිහාර යන්නට ප්‍රාතිහාර්ය, ආශ්චර්යය,